(8)

මගේ අංකය
எனது இல.
My No.
එම්/10/01/2001

ඔබේ අංකය
உமது இல.
Your No.

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos.
2889488
2889489

ෆැක්ස් අංකය
தொலைநகல்
Fax No.
2889488
2889489

ඊමේල්
மின்னஞ்சல்
E-mail
registrergen @sltnet.lk

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No.
565

චක්‍රලේඛ අංකය : 08/2008

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.
234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Baththaramulla.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR–GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය
இணைய தளம்
Web Site
www.rgd.gov.lk

දිනය/திகதி/Date : 2008/09/17

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**කල්ගත වූ උපත් ලියාපදිංචි කිරීම සහ අනුමාන වයස් සහතික නිකුත් කිරීම**

මගේ සමාංක හා 2001/07/26 දිනැති චක්‍රලේඛයට අමතරවයි.

02 එම චක්‍රලේඛයේ, 03 වන ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

3: 1 **ප්‍රකාශ පත්‍ර භාරගැනීම.**

කල්ගත වූ උපතක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය, නිසි ලෙස සම්පූර්ණ කරන ලද 24 වගන්තිය යටතේ වූ ප්‍රකාශ පත්‍රයක් සහ මෙයට යා කර ඇති "ඇමුණුම 1" අනුව සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශය අනිවාර්යයෙන්ම ලබා ගන්න. ඒ සමග පහත සඳහන් ලියවිලි භාර ගන්න.

i දෙමාපියන් විවාහක නම්, ඔවුන්ගේ විවාහ සහතිකය
ii උපත ලියාපදිංචි වී නොමැති බවට ලේඛන සෙවීමේ ප්‍රතිඵලය (3:2 හි උපදෙස් බලන්න).
iii පුද්ගලයාගේ **උපන් දිනය හා ස්ථානය** ඇතුලත් පහත සඳහන් ලියවිලිවලින් **එකක්** :
(අ) රෝහල් උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්
(ආ) ග්‍රාම නිලධාරී වාර්තාව හෝ එහි සහතික පිටපතක්
(ඇ) වතු උපත් වාර්තාව හෝ එහි සහතික පිටපතක්
(ඇ) වින්නඹු මාතාවගේ උපත් ලේඛනයේ පිටපතක්

iv ඉහත iii උප ඡේදයේ සඳහන් ලියවිල්ලක් **නැත්නම්, ඒ වෙනුවට** පහත සඳහන් ලියවිලිවලින් **එකක්** :

(අ) උපත සිදුවූ දිනට ආසන්නයේ දී සකස් කරන ලද කඳහන හෝ වේලපත්කඩය
(ආ) සෞඛ්‍ය වර්ධන සටහන
(ඇ) බෞතීස්ම සහතිකය
(ඈ) විෂය මුල්වරට පාසලට ඇතුලත් කිරීමේ ලේඛනයේ සහතික පිටපතක්
(ඉ) ශිෂ්‍ය කාර්යය දර්ශනය
(ඊ) වතු සුභසාධක නිලධාරියගේ වාර්තාව

vi මෙම ලියවිලි කිසිවක් ලබාගත නොහැකි නම්, ප්‍රකාශක දන්නා විස්තර පමණක් ඇතුලත් කරන ලද 24 වගන්තිය යටතේ වූ ප්‍රකාශ පත්‍රයක් සහ මෙයට යා කර ඇති "ඇමුණුම 1" අනුව සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශය භාර ගන්න.

### 3:2 ලේඛන සෙවීම

i ප්‍රකාශ පත්‍රය සමග මෙහි පහත සඳහන් ලියවිල්ලක මුල් පිටපත ලැබී ඇත්නම් ලේඛන සෙවීමේ ප්‍රතිඵලය ලබා ගැනීම අවශ්‍ය නොවේ.

(අ) රෝහල් උපත් වාර්තාව
(ආ) ග්‍රාම නිලධාරී වාර්තාව
(ඇ) වතු උපත් වාර්තාව

ii එසේ නැත්නම් උපත සිදුවූ දින සිට මාස තුනක (03) කාලයක් සඳහා ලේඛන සෙවීමේ වාර්තාවක් ලබාගන්න

### 3:3 දිවුරුම් ප්‍රකාශ සහ වාර්තා

ප්‍රකාශ පත්‍රයේ සඳහන් කරුණු සනාථ කර ගැනීම පිණිස මින් ඉදිරියට වාචික පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය නොවේ. ඒ සඳහා පහත සඳහන් කර ඇති පරිදි ආදර්ශ ආකෘතිය අනුව සකස් කළ දිවුරුම් ප්‍රකාශ සහ වාර්තා පමණක් ලබා ගැනීම ප්‍රමාණවත් ය.

| | ප්‍රකාශය කළ යුතු අය | ඇමුණුම |
|---|---|---|
| (අ) | මවුපියන් විවාහක නම් හෝ මවුපියන් අවිවාහකව සිටියදී පියා පිතෘත්වය භාරගන්නේ නම්, | |
| | i පියාගේ දිවුරුම් ප්‍රකාශය | 02 |
| | ii මවගේ දිවුරුම් ප්‍රකාශය | 03 |
| (ආ) | ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ මව හෝ පියා නොව විෂය නම් ඔහුගේ / ඇයගේ දිවුරුම් ප්‍රකාශය | 04 |
| (ඇ) | ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ඉහත (අ),(ආ) හි සඳහන් අයෙකු නොවේ නම්, ඔහුගේ / ඇයගේ දිවුරුම් ප්‍රකාශය | 05 |
| (ඈ) | ග්‍රාම නිලධාරීගේ වාර්තාව | 06 |
| (ඉ) | උපත ලැබූ ස්ථානය වත්තක නම්, වතු අධිකාරීගේ වාර්තාව | 07 |

සැ යු : ඉදිරිපත් කරන ලද ලියවිලි පිළිබඳව සැකයක් ඇත්නම් පමණක් ඒවාට අදාළ මුල් ලේඛන පරීක්ෂා කර බලන්න.

### 3:4 නිර්දේශ කිරීම

i ඉදිරිපත් වූ ලිඛිත සාක්ෂි සහ ලිඛිත ප්‍රකාශ මත ප්‍රකාශ පත්‍රයේ සඳහන් සියලුම කරුණු සනාථ වන්නේ නම්, උපත ලියාපදිංචි කිරීම නිර්දේශ කරන්න. ("ඇමුණුම 08" ආදර්ශ ආකෘතිය භාවිතා කරන්න).

ii එසේ නැත්නම් සනාථ වන කරුණු පමණක් ඇතුලත් කර අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම නිර්දේශ කරන්න. ("ඇමුණුම 09" ආදර්ශ ආකෘතිය භාවිතා කරන්න).

3:5 **අනුමැතිය සඳහා ලිපිගොනු ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යැවීම.**

ඉදිරිපත් වූ ලියවිලි පරීක්ෂා කර අවසන් වූ වහාම මෙහි පහත සඳහන් ලියවිලි ලිපිගොනුවක් ලෙස සකස් කර ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයට යවන්න.

i සම්පූර්ණ කළ අංක 840 රෝනියෝ ආකෘතියේ පිටපත් දෙකක්
ii ප්‍රකාශ පත්‍රය සහ "ඇමුණුම 1" (එකට අමුණා තිබිය යුතුය)
iii ලිඛිත ප්‍රකාශ සහ නිර්දේශය
iv ලබාගත් ලියවිලි (පැ.1, පැ. 2, ....... යන ලකුණු යොදා අනුපිළිවෙලින්)

3: 6 උපත් ලියාපදිංචි කිරීමට අනුමැතිය දීම.

i උපත ලියාපදිංචි කිරීම අනුමත කළහොත් උපත ලියාපදිංචි කිරීම සඳහා ප්‍රකාශ පත්‍රය කෙළින්ම අදාළ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් වෙත යවනු ලැබේ. ඒ බව ප්‍රකාශකට දන්වනු ලැබේ.

ii එසේ නැතහොත්, අනුමාන වයස් සහතිකයක් ප්‍රකාශක වෙත කෙළින්ම යවනු ලැබේ.

03 එබැවින් උපත සිදුවී අවුරුද්දක් ගතවීමෙන් පසු ඉදිරිපත් කෙරෙන ප්‍රකාශ පත්‍ර මත ඉහත දී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :

1 ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා

2 සියලුම දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා

3 සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත - දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා

4 ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැනගැනීම සඳහා

5 මධ්‍යම ලේඛනාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැනගැනීම සඳහා

6 සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා

(ඇමුණුම 1)

## උපත ලියාපදිංචි කරවා ගැනීම සඳහා කරනු ලබන දිවුරුම් ප්‍රකාශය

.....................................................................................................................
පදිංචි ...............................................................................................................
වන මම........................ ආගමික විශ්වාසයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස / දිවුරා ප්‍රකාශ කරමි.

1 මෙහි ප්‍රකාශක මම වෙමි.

2 * මගේ / ප්‍රකාශ පත්‍රයේ සඳහන් .............................................................. නැමැති විෂයයගේ උපන් දිනය ........................ බව ද / උපන් දිනය නොදන්නා බව ද / උපන් වර්ෂය .......................... බව ද,

3 * මාගේ ප්‍රකාශයේ සඳහන් ...................................................................... විෂයයගේ උපන් ස්ථානය .............................. දිස්ත්‍රික්කයේ .................... ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ .......................... නැමැති ස්ථානයේ බව ද / මා නොදන්නා බව ද,

4 * මාගේ / විෂයයගේ මව්පියන්ගේ විස්තර මා දන්නා බව ද/ නොදන්නා බවද,

5 * මාගේ / විෂයයගේ උප්පැන්නය මීට පෙර ලියාපදිංචි කර නොමැති බව මා හොඳාකාරව දන්නා බව ද,

6 මා විසින් මේ සමග ඉදිරිපත් කරනු ලබන .............. දින දරන ප්‍රකාශපත්‍රයේ සඳහන් කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 68වන වගන්තිය යටතේ අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් නියමව තිබෙන්නා වූ දඬුවම් විඳින්නට සිදුවන බවත් මා හොඳාකාරවම දන්නා බව ද ප්‍රකාශ කරමි.

මාගේ / විෂයයගේ අනාගත සුභසිද්ධිය සඳහා මා/ ඔහු/ ඇය/ උපන් වර්ෂය / උපන් දිනය ......................... මෙන් ද, උපන් ස්ථානය ............................. මෙන් ද, මවගේ නම ......................................................................... මෙන් ද, පියාගේ නම ......................................................................... මෙන් ද ඇතුලත් කර උප්පැන්න සහතිකයක් / අනුමාන වයස් සහතිකයක් නිකුත් කරන මෙන් මම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිමි.

......................... දින
.................................
......................... දී මා ඉදිරියේ දී
අත්සන් කරන ලදී.

.................................
ප්‍රකාශ කරුගේ අත්සන

.................................
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/
සාමවිනිසුරු ( නිලමුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න

(ඇමුණුම 2)

# පියාගේ ප්‍රකාශය

..........................................................................................................................................

පදිංචි ..........................................................................................................................

වන මම........................... ආගමික වශයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස / දිවුරා ප්‍රකාශ කරමි.

සම්පූර්ණ නම :..........................................................................................

පදිංචිය :..............................................................................................

රැකියාව :..............................................................................................

වයස :.................. ජාතික හැඳුනුම්පත් අංකය .................................... මෙසේ කියා සිටී.

මා මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ මාගේ .................. වෙනි දරුවා වන ..........................................................................ගේ උපත ලියාපදිංචි කිරීම සඳහා ය. ............................................................ උපන්නේ .................. දින ........................................ හිදී ය. මා ................................................ දින සිට ............................................................................ සමග අඹු සැමියන් ලෙස ........................................................ නිවසේ ජීවත් වෙමි. අපි විවාහ වූයේ ........................... දින ................................................. දී ය./ අපි විවාහ වී නැත. ................................................................................ නැමැති දරුවා මට දාව උපන් .................. වෙනි දරුවා ය. අපගේ නොදැනුවත් කම නිසා මෙම උපත ලියාපදිංචි කරවා ගැනීමට බැරි විය. දරුවාගේ අනාගත සුභ සිද්ධිය සඳහා උපත ලියාපදිංචි කර දෙන්න. මට කීමට ඇත්තේ මෙපමණයි. ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කොට ප්‍රකාශ කරමි.

............................ දින

........................................

............................ දී මා ඉදිරියේ දී

අත්සන් කරන ලදි.

............................

ප්‍රකාශ කරුගේ අත්සන

....................................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ සාමවිනිසුරු ( නිලමුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න

(ඇමුණුම 3)

<u>මවගේ ප්‍රකාශය</u>

.................................................................................................................
පදිංචි .................................................................................................................
වන මම......................... ආගමික වශයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස / දිවුරා ප්‍රකාශ කරමි.

සම්පූර්ණ නම :.........................................................................................

පදිංචිය :.........................................................................................

රැකියාව :.........................................................................................

වයස :................. ජාතික හැඳුනුම්පත් අංකය ................................... මෙසේ කියා සිටී.

මා මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ මාගේ ................. වෙනි දරුවා වන ...........................................................................ගේ උපත ලියාපදිංචි කිරීම සඳහා ය. ........................................................... උපන්නේ ................. දින ...................................... හිදී ය. මා ................................................ දින සිට ......................................................................... සමග අඹු සැමියන් ලෙස ........................................................ නිවසේ ජීවත් වෙමි. අපි විවාහ වූයේ ......................... දින ................................................ දී ය./ අපි විවාහ වී නැත. .............................................................................. නැමැති දරුවා මගේ සැමියාට දාව මට උපන් ................. වෙනි දරුවා ය. අපගේ නොදැනුවත් කම නිසා මෙම උපත ලියාපදිංචි කරවා ගැනීමට බැරි විය. දරුවාගේ අනාගත සුභ සිද්ධිය සඳහා උපත ලියාපදිංචි කර දෙන්න. මට කීමට ඇත්තේ මෙපමණයි. ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කොට ප්‍රකාශ කරමි.

........................... දින
......................................
........................... දී මා ඉදිරියේ දී
අත්සන් කරන ලදී.

...........................
ප්‍රකාශ කරුගේ අත්සන

...............................
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/
සාමවිනිසුරු ( නිලමුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න

(ඇමුණුම 4 )

**විෂයයගේ ප්‍රකාශය**

.............................................................................................................

පදිංචි ....................................................................................................

වන මම.......................... ආගමික වශයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස / දිවුරා ප්‍රකාශ කරමි.

සම්පූර්ණ නම :...................................................................................

පදිංචිය :...................................................................................

රැකියාව :...................................................................................

වයස :.................. ජාතික හැඳුනුම්පත් අංකය ....................................

මට පෙන්වන ප්‍රකාශ පත්‍රය මා විසින් ඉදිරිපත් කළ එකක් බව පිළිගනිමි. මා ........................ දින ........................ දී උපත ලබා ඇති බව මා අසා තියෙනවා. මාගේ මව.........................................................................................මාගේ පියා.............................................................................................. ඒ දෙපල විවාහ වී ඇත / නැත . මට උප්පැන්න සහතිකයක් නොමැත. එය ලියාපදිංචි කර නැති බව මා සොයා දැනගතිමි. මාගේ අනාගත සුභ සිද්ධිය සඳහා උප්පැන්න සහතිකය ලියාපදිංචි කර දෙන්න. මට කීමට ඇත්තේ එපමණයි. ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කොට ප්‍රකාශ කරමි.

............................ දින
......................................
............................ දී මා ඉදිරියේ දී
අත්සන් කරන ලදී.

..................................
ප්‍රකාශ කරුගේ අත්සන

..................................
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/
සාමවිනිසුරු ( නිලමුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න

(ඇමුණුම 5)

## ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ පියා, මව, විෂය නොවන අයකු විසින් කරනු ලබන ප්‍රකාශය

....................................................................................................

පදිංචි ....................................................................................................

වන මම.......................... ආගමික වශයෙන් මෙහි පහත සඳහන් කරුණු ප්‍රතිඥා දී සත්‍ය ලෙස / දිවුරා ප්‍රකාශ කරමි.

01 මෙහි ප්‍රකාශක මම වෙමි.

02 ප්‍රකාශ පත්‍රයේ සඳහන් ........................................................ නැමැති විෂයගේ උපන් දිනය ........................ බව ද / උපන් දිනය නොදන්නා බව ද / උපන් වර්ෂය .......................... බව ද,

03 මාගේ ප්‍රකාශයේ සඳහන් .................................................................. විෂයගේ උපන් ස්ථානය ............................ දිස්ත්‍රික්කයේ ..................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .......................... නැමැති ස්ථානයේ බව ද / මා නොදන්නා බව ද,

04 විෂයගේ මව්පියන්ගේ විස්තර මා දන්නා බව ද/ නොදන්නා බවද,

05 විෂයගේ උප්පැන්නය මීට පෙර ලියාපදිංචි කර නොමැති බව මා හොඳාකාරව දන්නා බව ද,

06 මා විසින් මේ සමග ඉදිරිපත් කරනු ලබන ............... දින දරන ප්‍රකාශපත්‍රයේ සඳහන් කරුණු සත්‍ය බවත් නිවැරදි බවත් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 68වන වගන්තිය යටතේ අසත්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් නියමව තිබෙන්නා වූ දඩුවම් විඳින්නට සිදුවන බවත් මා හොඳාකාරවම දන්නා බව ද ප්‍රකාශ කරමි.

විෂයගේ අනාගත සුභසිද්ධිය සඳහා ඔහු/ ඇය/ උපන් වර්ෂය / උපන් දිනය .......................... මෙන් ද, උපන් ස්ථානය .............................. මෙන් ද , මවගේ නම ..................................................................................... මෙන් ද, පියාගේ නම.......................................................................................... මෙන් ද ඇතුලත් කර උප්පැන්න සහතිකයක් / අනුමාන වයස් සහතිකයක් නිකුත් කරන මෙන් මම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිමි.

.......................... දින

....................................

.......................... දී මා ඉදිරියේ දී අත්සන් කරන ලදී.

..........................

ප්‍රකාශ කරුගේ අත්සන

....................................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ සාමවිනිසුරු ( නිලමුද්‍රාව තබන්න)

* අදාළ නොවන වචන කපා හරින්න

(ඇමුණුම 6)

# ග්‍රාම නිලධාරීගේ වාර්තාව

සම්පූර්ණ නම :...............................................................................................

පදිංචිය :...........................................................................................

රැකියාව :...........................................................................................

වයස :.................. ජාතික හැඳුනුම්පත් අංකය ....................................

මේ ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කර ඇති .................................................... නැමැති අය මා හඳුනමි. ................................................................................ නැමැති දූරුවා .................................... දින ........................................... නැමැති නිවසේදී උපන් බවට ...................................................................... නැමැති අය මට වාර්තා කර ඇත . එම උපත ........................................... අංක යටතේ වාර්තා කර ඇති බවත්, දරුවාගේ පියා ................................................................ බවත් මව ........................................................................ බවත් ඔවුන් අඹුසැමියන් ලෙස මාගේ වසමේ ජීවත් වන බවත් ප්‍රකාශ කරමි. ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.............................................
ග්‍රාම නිලධාරී
(නිල මුද්‍රාව තබන්න)

දිනය :..............................................

(ඇමුණුම 7)

### වතු අධිකාරිගේ ප්‍රකාශය

1 ප්‍රකාශපත්‍රය ඉදිරිපත් කරන අයගේ විස්තර

1.1 සම්පූර්ණ නම : ..............................................................................

1.2 ලිපිනය :..............................................................................

1.3 රැකියාව :..............................................................................

1.4 වයස :.................. 1.5 ජාතික හැඳුනුම්පත් අංකය ..............................

2 ප්‍රකාශපත්‍රයේ සඳහන් තොරතුරු

2 1 දරුවාගේ නම :..............................................................................

2 2 උපන් දිනය හා ස්ථානය :..............................................................

2 3 පියාගේ සම්පූර්ණ නම :..............................................................

2 4 මවගේ සම්පූර්ණ නම :..............................................................

උප්පැන්න ලියාපදිංචි කිරීම සඳහා මෙම ප්‍රකාශපත්‍රය ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් .................................................. නැමැති අය ............ දින සිට මෙම වත්තේ පදිංචිව සිටින බව සහතික කරමි. ප්‍රකාශපත්‍රයේ සඳහන් තොරතුරු වතු උපත් ලේඛනයේ අංක .................... හා .............. දින යටතේ ඇතුලත් කර ඇත/ නැත . ඔහු/ ඇය ...................... දින සිට මෙම වත්තේ පදිංචිව සිටින බව සහතික කරමි.

දිනය : ........................ ..........................................

වතු අධිකාරි
(නිල මුද්‍රාව තබන්න)

(ඇමුණුම 8)

**සිදුවී ඇති කල්ගත වූ උපතක් ලියාපදිංචි කිරීම**
**අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ නිර්දේශය**

01 මෙහි ප්‍රකාශක ........................................................................................ වේ.
(විෂයය/ මව/ පියා/ උපන්දුවක් දක්වන තැනැත්තා)

02 පරීක්ෂණයේදී පහත සඳහන් අය සාක්ෂි දුන්හ.

(i) ප්‍රකාශක :........................................................................................

(ii) විෂයයගේ මව : ........................................................................................

(.iii) උපන් වාර්තා ඉදිරිපත් කළ පුද්ගලයා : ........................................................
(නම සඳහන් කරන්න)
රෝහල් උපන් ලේඛන රැගත් නිලධාරී / වතු උපන් වාර්තා රැගත් නිලධාරී / ග්‍රාම නිලධාරී / වතු සුභ සාධක නිලධාරී / පවුල් සෞඛ්‍ය නිලධාරී/ වින්නඹු මාතාව

03 විෂය මා ඉදිරියට පමුණුවන ලදි. ඔහු / ඇය පෙනුමෙන් වයස අවු ......... පමණ වන පුරුෂයෙකි /ස්ත්‍රියකි.

04 i) විෂයයගේ දෙමාපියන් විවාහකය. ("පි 01" විවාහ සහතිකය බලන්න)
(ii) විෂය උපන් පසු මව්පියන් විවාහ වී ඇත. (ප්‍රකාශ පත්‍රයේ 10 තීරණයෙහි පිතෘත්වය පිළිගනිමින් මව්පියන් අත්සන් කර ඇත)
(iii) විෂයයගේ මව අවිවාහකය

05 විෂයයගේ උපන්දිනය, උපන් ස්ථානය, ස්ත්‍රී / පුරුෂ භාවය හා මවගේ නම සනාථ වේ. .................................................. (ලියවිල්ලේ විස්තර ඇතුලත් කරන්න) එය "පි 03" මෙන් ඉදිරිපත් වේ. එය සත්‍ය ලියවිල්ලක් බවට මම සෑහීමකට පත් වෙමි.

06 මෙම උපත මීට පෙර ලියාපදිංචි වී නැත .......................... කොට්ඨාසයේ ..................... දින සිට .............. දක්වා ලේඛන සෙවීමේ ප්‍රතිඵලය "පි 4" වේ. ලේඛන සොයා ඇත්තේ නිවැරදි කොට්ඨාසයේ ය.

07 ප්‍රකාශ පත්‍රයේ සඳහන් සියලුම විස්තරවල සත්‍යතාවය ඉදිරිපත් වී ඇති ලිඛිත සහ වාචික සාක්ෂිවලින් සනාථවන බවට මම සෑහීමකට පත් වෙමි. උපත ලියාපදිංචි කිරීම මම නිර්දේශ කරමි.

දිනය :..............................

අත්සන :................................

කාර්යාලය: .....................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් / අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
(නිල මුද්‍රාව තබන්න)

(ඇමුණුම 09)

# අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම සඳහා නිර්දේශය

01 මෙහි ප්‍රකාශක .................................................................................
වේ. (විෂය/ මව/ පියා/ උපන්දුවක් දක්වන තැනැත්තා)

02 පරීක්ෂණයේදී පහත සඳහන් අයගෙන් ලිඛිත සාක්ෂි ලබා ගතිමි.

(i) ප්‍රකාශක :.......................................................................

(ii) විෂය :.......................................................................

(iii) මව/ පියා/ භාරකරු : ..........................................................

03 මා ඉදිරියේ පෙනී සිටි විෂය පෙනුමෙන් වයස අවු .............. පමණ වන පුරුෂයෙකි / ස්ත්‍රියකි.

04 විෂයගේ දෙමාපියන්ගේ විස්තර ලිඛිත සාක්ෂිවලින් සනාථ වේ /සනාථ නොවේ.

05 මව්පියන් විවාහකය / අවිවාහකය. පියා විසින් පිතෘත්තවය පිළිගෙන ඇත.

06 විෂය උපන් වර්ෂය හා ස්ථානය ........................................... මගින් සනාථ වේ.

07 මෙම උපත මීට පෙර ලියාපදිංචි වී නැත.

08 ප්‍රකාශක විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය අනුව විෂයගේ උපන් වර්ෂය .................... මෙන් ද, උපන් ස්ථානය ........................................ මෙන් ද, නම...................................................................... මෙන් ද, මවගේ නම ...................................................................... මෙන් ද, පියාගේ නම ...................................................... මෙන් ද ඇතුලත් කර අනුමාන වයස් සහතිකයක් නිකුත් කිරීම මම නිර්දේශ කරමි.

දිනය :.................................

...............................................
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්
නිලමුද්‍රාව

ස්ථානය :.........................................